# අභිකුණ්ඨක ජනතාව හා බැඳි සිරිත් විරිත් පිළිබඳ මානව විද්‍යාත්මක අධ්‍යයනයක් (කුඩාගම ග්‍රාමය ඇසුරින්)

**සේමසිංහ ආර්.එස්.එම්.ටී.එල්[1], විජේනායක ඩබ්.එම්.යූ.එන්[2], දේශානි එම්.කේ.එස්.[3]**

ආදි මානවයාගේ සිට අද්‍යතන සමාජ ක්‍රමය දක්වා විකාශනය වූ මානව ශිෂ්ටාචාරයන් වර්තමානය වන විට වියැකී ගොස් ඇත. එලෙස වියැකී යන ජන කොට්ඨාසයක් වන අභිකුණ්ඨක ජනයාගේ සිරිත් විරිත් වර්තමානය වන විට කෙතරම්දුරට ශේෂ වී ඇත්දැයි විමසීම මෙම පර්යේෂණයේ අරමුණ වෙයි. පර්යේෂණ ක්‍රමවේදය ලෙස ක්ෂේත්‍ර අධ්‍යයන හා සාහිත්‍ය මූලාශ්‍රය අධ්‍යයනය සිදු කරන ලදී. අනාගතයේදී ශ්‍රී ලාංකේය සමාජයේ දැක ගැනීමට නොහැකි වේ යැයි උපකල්පනය කළ හැකි ජන සමූහයක් ලෙස සංක්‍රමණික දිවි පෙවෙතක් ගෙවන අභිකුණ්ඨක ජනතාවගේ ජන ජීවිතය හා බැඳි චර්යා ධර්ම පිළිබඳ කරුණු බොහෝමයක් පවතී. මේවා ප්‍රාදේශීය ව වෙනස් වේ. යමෙක් ඉපදීමට පෙර සිට ම නිර්මාණය වූ සිරිත් විරිත් මොවුන්ගේ සංස්කෘතික අනන්‍යතාවයකි. උපතේ සිට මරණය තෙක් විවිධ වූ මොවුන්ගේ ඇතැම් මූල සිරිත් විරිත් ක්‍රමයෙන් විපර්යාසයකට ලක් ව ඇත. ගැබිණියන් උදෙසා පවත්වන විශේෂ චාරිත්‍ර අතර **බ් ඩ් පුට්ටුකාරි** ලෙස ඇය හඳුන්වන අතර ගැබ්ගත් පසු දැලි, රැවුල් කොණ්ඩා නොකපා භාර්යාව රැක බලා ගැනීම  පුරුෂයාගේ යුතුකම ලෙස සලකයි. දැලි, රැවුල් කොණ්ඩා කැපීම කුසෙහි සිටින දරුවාට අයහපත උදාකරන බව මොවුන්ගේ දැඩි විශ්වාසය යි. දරුවකු උපන් දින "සින්න බිට" ලෙස හඳුන්වන අතර පොල් ගෙඩියක් පලා එයට දෙහි දමා එය මවට පෙවීම සිදු කරයි. උපන් බිළිදා සත් දිනක් කිසිවකුට නොපෙන්වයි. බිළිදාගේ ස්ත්‍රී පුරුෂභාවය බැලීම ඉපිද දින හතකින් චාරිත්‍රානුකූල ව සිදු කරයි. ''පැද්ද හයින් බිච්චි මංගල්ලය" ලෙස මල්වර වීම හඳුන්වන අතර තරුණිය ගෙයින් පිටමං කොට ඖෂධීය කොළවලින් සැකසූ පැළක දින පහක් තබයි. මේ කාලයේ රැහේ  සියල්ලන් ඇගේ පෝෂණය පිළිබඳ සැලකිළිමත් වේ. දින පහ සපිරෙන දින උදෑසන යක්ෂ ප්‍රේත කිළි දෝෂ නිවාරණ යක්කංකාරියකි. ඉතා චාම් සරල නැකත් වේලපත්කඩ  බැලීමෙන් තොර ව සිදුවන විවාහාමංගල්ලය, තැල්ලපුල් ෂල් කර්නම් මංගල්ලය ලෙස හැඳින්වේ. තහනම් විවාහයක දී ඔවුනට ම  ආවේණික වූ දඩුවම් ක්‍රම පවතී. කතරගම දෙවි ඇදහිල්ල රෝග සුව කරන බව ඔවුන්ගේ විශ්වාසය යි.  අවමංගල්ලයක දී මියගිය පුද්ගලයා නිතර ගැවසුණු ස්ථානයේ ඔහු කැමති ආහාර පාන ඇඳුම් පැළඳුම් ආදිය තබා යාතිකා කර අවසානයේ එම ස්ථානයට කිසිවෙකුට ඇතුළත් විය නොහැකි පරිදි තිර රෙද්දකින් වසයි. එම ස්ථානයේ මියගිය තැනැත්තාගේ බිරිද හෝ ස්වාමියා තනිව රැයක් ගත කළ යුතු ය. ඒ අනුව නිගමනය කළ හැක්කේ වර්තමානය වන විට අභිකුණ්ඨක ජනතාව අතර පවතින්නා වූ ඔවුන්ටම ආවේණික වන ලද සිරිත් විරිත් රැක ගැනීම උදෙසා මහත් වූ පරිශ්‍රමයක් දරන බව යි.

**ප්‍රමුඛ පද :** අභිකුණ්ඨක, ජන සමාජය, සිරිත් විරිත්

[1,2,3] සමාජීය විද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. upulc460@gmail.com